**මුසලි ප්‍රාදේශීය සභාව**

**-----------------------**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2018 වර්ෂයේ මූල්‍යප්‍රකාශන 2019 මාර්තු **27** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍යප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් **31** දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට **මුසලි** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. | ඉදිරි කාලයේදී හෙළිදරව් කරනු ලැබේ. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

---------------------------------------------------------

.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| භාණ්ඩ ලැබීම් පත්‍රිකා, විශේෂ තහවුරු පත්‍රිකා නොමැති වීම හේතුවෙන් රු.113,008 වටිනා වියදම් තහවුරු කළ නොහැකි වී තිබුණි. | භාණ්ඩ ලැබීම් පත්‍රිකා සහ විශේෂ තහවුරු පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. | ඉදිරි කාලයේදී මෙය ක්‍රියාවට නංවනු ලැබේ. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික ක්‍රියාකාරී වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි. | ඉදිරි කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා නිලධාරියෙකුට ගෙවූ අත්තිකාරම් මුදල රු.150,969 හෝ අත්තිකාරම් මුදල වසර 18 කට වැඩි කාලයක් තිස්සේ ආපසු ලබාගැනීමට එලදායී ලෙස කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් මුදල් ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. | අත්තිකාරම් නිවැරදි කළ යුතුයි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) | විධායක ශ්‍රේණියේ නිලධාරියෙකුට දිය යුතු රු.5000 ක් වටිනා අත්තිකාරම් රියදුරුට ලබා දී තිබුණි. | අත්තිකාරම් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට ලබාදිය යුතුයි. | ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලැබේ. |

**2. මූල්‍ය සමාලෝචනය** --

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,153,708 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,896,803 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ හිඟ ආදායම පසුගිය වර්ෂයේ රු.4,804,055 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ තථ්‍ය මුළු හිඟය රු.6,711,899 වීම හේතුවෙන් රු.1,907,844 ක වර්ධනය ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවයක් ලෙස නිරීක්ෂණය විය.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | 2018.12.31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | 2017.12.31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| කුලී | 4,698,200 | 5,268,494 | 1,475,171 | 3,200,000 | 2,038,341 | 1,372,171 |
| බලපත්‍ර ගාස්තු | 490,000 | 566,371 | - | 240,000 | 421,100 | - |
| වෙනත් ආදායම් | 3,152,500 | 6,337,717 | 5,236,728 | 3,776,530 | 4,498,983 | 3,431,884 |
| එකතුව | **8,340,700** | **12,712,582** | **6,711,899** | **7,216,530** | **6,958,424** | **4,804,055** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ හිඟ ආදායම රු.1,900,000 කින් වර්ධනය වී තිබීම සමාලෝචිත වර්ෂයේ ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවය පෙන්නුම් කරයි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලැබේ. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් අයකළ යුතු හිඟ කුලී ශේෂයන්ගේ එකතුව රු.1,475,171 ක මුදල අයකිරීමට ඵලදායී ලෙස කටයුතු කර නොතිබුණි. | දිගු කාලීන හිඟ කුලී ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු උසාවි දඩ මුදල් ශේෂය රු.2,575,053 කි. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි |

(ආ ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දින රු.2,137,871 ක මුද්දර ගාස්තු අයකළ යුතුව තිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රධාන විෂයයන් 30 ක් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා වැළඳ ගත යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා කිසිවක් වැලඳ ගෙන නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා නිකුත් කිරීමට කටයුතු කළ යුතුයි. | ඉදිරි කාලයේදී අතුරු ව්‍යවස්ථා නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ව්‍යාපෘතිය ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන උපයෝගී කරගෙන ග්‍රාමීය පානීය ජල සැපයීමේ සිලාවතුරෙයි ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 18 වන දින වැඩ අවසන් කළ සභාවට භාරදිය යුතු වුවත් එසේ අවසන් කර නොතිබුණි. | ග්‍රාමීය පානීය ජල සැපයීමේ වැඩසටහන අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. | මෙම වැඩසටහන 2018 වර්ෂයේ සිට පැවත එන වැඩසටහන් ලෙස 2019 වර්ෂයේ සිදුකරමින් පවතී. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 වන දිනැති අංක පොදු/2018/61 දරන විගණන ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධනයට වෙරළාශ්‍රිත සම්පත් ආරක්ෂා කළ යුතු අතර තිරසාර ලෙස දැනුවත් කිරීම් කටයුතු සහ සමුද්‍රීය සහ වෙරළාශ්‍රිත දූෂණය පාලනය කිරීමේ සැලසුම් කිසිවක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුයි. | ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලැබේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 62 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 55 ක් වී තිබුණු අතර සභාවේ පවතින පුරප්පාඩු 07 ක් පිරවීම සඳහා ඵලාදයී ලෙස කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුයි. | ජ්‍යෙෂ්ඨ සහ ද්විතියික ශ්‍රේණිවල පුරප්පාඩු පිරවීම පළාත් සභාව විසින් කටයුතු තීරණය කළ යුතුයි. ප්‍රාථමික ශ්‍රේණිය සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලැබේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම්වල සුරක්ෂිතතාවය තහවුරු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රථ වාහන අංගනය සඳහා වෙන්කර ඇති කොටසේ වාහන නවතා තිබීම සඳහා වූ රථ වාහන අංගනයේ ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම නිසා වාහන විවෘත ප්‍රදේශයක නවතා තිබුණි. | සභාවේ වාහන ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුයි. | ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලැබේ. |

### 3.3.2 නඩත්තු සහ අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් උපයෝජනයට නොගන්නා වාහන 16 ක් පිළිබඳ පසුගිය වසර 8 කට වැඩි කාලයක් තිස්සේ කටයුතු කර නොතිබුණි. | උපයෝජනයට නොගත් වාහන පිළිබඳව ඵලදායීව කටයුතු කළ යුතුය. | එම වාහන විකිණීමට පියවර ගෙන නොතිබුණි. |

### 3.3.3 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතයට ගන්නා ලද සභාවට අයිතිය පවරා නොගත් රු.11,350,000 ක් වටිනා වාහන 08 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | සභාවට අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | සභාව විසින් භාවිතයට ගන්නා රු.6,062,157 වටිනා ගොඩනැගිලි 23 ක් ස්ථාපිත කර ඇති ඉඩම්වල අයිතිය සභාවට යාවත්කාලීනව පවරා නොතිබුණි. | සභාව විසින් භාවිතයට ගන්නා ලද ඉඩම් 23 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 3.4 ප්‍රසම්පාදනයන්

-----------------

### 3.4.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.4.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවස්ථාවන් 03 කදී සභාව විසින් කරනු ලැබූ අලුත්වැඩියාවන් සඳහා එකතුව රු.1,238,81 ක් වැය කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 ප්‍රකාරය ප්‍රසම්පාදන අත්පොතට ඇමුණුමක් ලෙස 2014 ජූලි 04 වන දින නිකුත් කර 28 වන ඇමුණුමේ 2.14.1 හි සඳහන් පරිදි වාහන අලුත්වැඩියාවන් සඳහා උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොතේ ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුයි. | ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලැබේ. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාවන් සඳහා වූ අයවැයගත වියදම් රු.1,830,000 ක් ව තිබූ නමුත් තථ්‍ය වියදම් | අයවැය පිළියෙල කිරීමේදී නිවැරදි ලෙස විශාල වෙනස්කම් ඇති නොවන ලෙසත් අයවැය පිළියෙල කළ යුතු වීම | ඉදිරි කාලයේදී කාර්යක්ෂම ලෙස අයවැය පිළියෙල කරනු ලැබේ. |

රු.2,996,899 ක් වීම නිසා රු.1,166,899 ක වෙනසක් ඇති වී තිබීම අකාර්යක්ෂම අයවැය පිළියෙල කිරීමක් පෙන්නුම් කරයි.